## බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2008.10.31

වේලාව : පෙ.ව.11.00

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

01. ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා
02. ගරු උපසභාපති - සුමේද චමින්ද බස්නායක මැතිතුමා
03. ගරු නගර සභා මන්ත්‍රී- ධර්මසේන සමරසිංහ මැතිතුමා.
04. ගරු නගර සභා මන්ත්‍රී- ආර්.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
05. ගරු නගර සභා මන්ත්‍රී- ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
06. ගරු නගර සභා මන්ත්‍රී- එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
07. ගරු නගර සභා මන්ත්‍රී- විමලසේන වැවේගෙදර මැතිතුමා.
08. ගරු නගර සභා මන්ත්‍රී- එම්.ටී.එම්.රූමි මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය:-**

01. නාගරික ලේකම් - ආර්.ඩී.නලින් පුෂ්පකුමාර මහතා

**සහභාගීනොවූවෝ:-**

01. නාගරික මන්ත්‍රී - යූ.එච්.ගාමිණී මැතිතුමා

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථා කරමින්, අද දින පැවැත්වෙන්නේ 2008 වර්ෂයේ ඔක්තෝබර් මාසයට අදාළ සභා රැස්වීම බවත්, ඒ සඳහා සහභාගිවීමට පැමිණ සිටින ,ගරු උපසභාපතිතුමා, නාගරික මන්ත්‍රීතුමන්ලා,ලේකම්තුමා හා පුවත්පත්කලාවේදී මහතා සාදරයෙන් පිළිගන්නා බව ප්‍රථමයෙන් පැවසීය.

-02-

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, ජාතික කියවීමේ මාසය නිමිතිකරගෙන නව කියවීම් ශාලාවක් අද දින ජනතා අයිතියට පවරාදීමේ කාර්යය ඉටුකරනු ලැබූ බවත්, මෙමගින් මෙම ප්‍රදේශයේ ජනතාවට මහඟු සේවයක් සැලසෙන බව අවධාරණය කරන ලදී.

මෙම වර්ෂයේ නගර සභා මුදල් නොයොදවා ජාතික සවිය,ගම නැගුම,මග නැගුම යන ව්‍යාපෘතීන් හරහා නගර සභා බල ප්‍රදේශයේ විශාල සංවර්ධනයක් ඉටුකර තිබෙන බව දැන් වූ ගරු සභාපතිතුමා, එම සංවර්ධන කාර්යයන් සාර්ථකව ඉටුකිරීමට මෙම සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් විශාල සහයෝගයක් ලැබුණු බවත්. ඒ සම්බන්ධව සිය ප්‍රණාමය ගරු මන්ත්‍රීතුමන්ලා වෙත පළකර සිටින බවත් දැන්වීය.

2009 වර්ෂය සඳහා අයවැය කෙටුම්පත අද දින සභාවට ඉදිරිපත් කරන බවත්, එම අයවැය කෙටුම්පතේ කලයුතු සංශෝධනයන්, අඩුපාඩු හා ගරු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා හා අදහස් තිබේ නම් ඒවා ද ඉදිරිපත් කරන ලෙස තමන් ඉල්ලා සිටින බව දැන්විය.

ඉදිරියේ දී කොට්ඨාශ ක්‍රමයට මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය නීති සම්පාදනය වෙමින් පවතින බවත්, එම නිසා ගරු මන්ත්‍රීවරුන්ට මීට වඩා වැඩි සේවයක් කිරීමට සිදුවන බවත්, එබැවින් මේ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තම තමන් නියෝජනය කරනු ලබන ප්‍රදේශවල තිබෙන අඩුපාඩු සකස් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින්, සභාවේ ඉදිරිවැඩ කටයුතු කරගෙන යාමට ලේකම් මහතාට ආරාධනය කරන ලදී.

(03). **2008.09.25 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2008.09.25 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවිය.

05. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **බළන්ගොඩ බස්නැවතුම්පල ඩී.20 කඩ කාමරය:**

බළන්ගොඩ,කොටුගොඩැල්ල පාර අංක: 16 දරණ ලිපිනයේ පදිංචි ඩී.වී.ආර්.ධර්මසේන මහතා විසින් ඉදිරිපත් කර ඇති 2008.10.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉහත අංක දරණ කඩ කාමරයේ හිඟ බදු මුදල 2008.10.30 වන දිනට ගෙවා ඉතිරි මුදල නොවැම්බර් මස 03 වන දින ගෙවීමට එමගින් අවසර ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සාකච්ඡා කළ සභාව, අදාල මුදල ගෙවීමට අවසර ලබාදීමටත්, නැවත එම අය වෙත කඩ කාමරය බදු ලබාදීම සුදුසු බවටත් තිරණය කරන ලදී.

05:02 **ආනන්ද මෛත්‍රීය මාවත( අංක: 151 ) අසල සුදර්ශනගම 1 පටුමගට සම්බන්ධ වන පාර කොන්ක්‍රීට් කිරීම:**

උක්ත කරුණට අදාළව , බළන්ගොඩ , ආනන්ද මෛත්‍රීය මාවත ,සමෘද්ධි සමිතියේ සභාපති විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉහත කර්මාන්තය ආනන්ද මෛත්‍රීය මාවත සමෘද්ධි සමිතිය විසින් ගිවිසුම් අත්සන් කර වැඩ ආරම්භ කරනු ලැබූ බවත්, කර්මාන්තයේ වැඩ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය භාණ්ඩ හා ද්‍රව්‍ය ණයට ලබාගැනීමට සිදු බවත්, එසේ ලබාගන්නා ලද භාණ්ඩ හා ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීමට සිදුව ඇති නිසා කර්මාන්තයේ වටිනාකමින් 50% ක මුදලක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදී.

අදාල බිල්පත් වල වටිනාකමින් 50% ක මුදලක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:03 <u>නොමිලයේ පොහොර පැකට් ප්‍රදානය කිරීම:</u>

උක්ත කරුණට අදාළව , කල්තොට පොලිස් ස්ථානයේ මහජන සම්බන්ධතා නිලධාරී ඉරෝෂන් ජයසේකර මහතා විසින් එවා ඇති 2008.10.30 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

කල්තොට පොලිස් බල ප්‍රදේශයට අයත් දියවින්න,කෝන්ගහමංකඩ ප්‍රදේශවල 150 ක් පමණ වු පිරිසකට කොම්පෝස්ට් පොහොර පැකට්ටුව බැගින් ප්‍රදානය කිරීමට මැදිහත්වන ලෙස ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සාකච්ජා කල සභාව, උක්ත ලිපිය යොමුකල නිලධාරී මහතාට මේ සම්බන්ධව සාකච්ජා කිරීමට මෙම සභාව වෙත පැමිණෙන ලෙස දන්වා යැවීමට තීරණය කරන ලදී.

05:04 <u>මළාපවහන ප්‍රතිකර්ම පද්ධතිය ඉදිකිරීම සඳහා පළාත් පාලන ආයතන වලට ආධාර ලබාදීම.</u>

ඉහත කරුණට අදාළව ගරු පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා විසින් එවා ඇති 2008.10.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම නගර සභාව අනෙකුත් පළාත් පාලන ආයතනයන්ට ද ආදර්ශයක් වන පරිදි, දැනට සාර්ථකව ක්‍රියාත්මක කරනු ලබන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධව දක්වනු ලබන උනන්දුව හා කැපවීම වඩාත් අගය කොට සලකනු ලබන අතර, එසේම මළාපවහන ප්‍රතිකර්ම පද්ධතියක් ඉදිකිරීම මගින් දැනට මෙම නගර සභා බල ප්‍රදේශයට ගැටළුවක්ව පවතින මළ අපද්‍රව්‍ය අවිධිමත්ව බැහැරලීම හා එමගින් ඇතිවන නොයෙකුත් පාරිසරික හා සමාජීය බලපෑම් වලක්වාලීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරන බවත්, ඒ සඳහා දිරිදීමක් වශයෙන් පුර්වෝක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.38,50000.00 ක ප්‍රදානයක් මෙම නගර සභාව වෙත ලබාදීමට තීරණය කර ඇති බව එමගින් දන්වා තිබෙන බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මිළදී ගැනීම් ඉතාමත් කඩිනමින් ලබාගෙන සෘජු කම්කරු ශ්‍රමය හා ඇස්තමේන්තු වටිනාකමින් 25%ක සහාදායකත්වයක් ලබා දී මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරීමට අනුමත කරන ලදී.

05:05 <u>විද්‍යුත් පුස්තකාලය හා විදුනැණ පියස සඳහා සේවා ගාස්තු සංශෝධනය කිරීම</u>

විද්‍යුත් පුස්තකාලයේ හා විදුනැණ පියස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සේවා සඳහා පහත සඳහන් පරිදි ගාස්තු සංශෝධනය කිරීමට අවසර ලබාදෙන ලෙස ඉල්ලා පරිඝණක දත්ත සටහන් ක්‍රියාකාරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, අදාල ගාස්තු අයකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

| සේවාව | දැනට අයකරන ගාස්තුව රුපියල් | යෝජිත ගාස්තුව රුපියල් | සංශෝධනයට හේතුව |
|---|---|---|---|
| 01. විද්‍යුත් පුස්තකාල සාමාජික ගාස්තුව | 100/- | 250/- | පිරිවැය පියවාගැනීමට |
| 02. විද්‍යුත් පුස්තකාල අයදුම්පත් | නව ගාස්තු අය කිරීමකි. | 10/- | පිරිවැය පියවා ගැනීමට |
| 03. A4 Print Out | 15.00 + Vat (17.25 ) | 13.00+Vat ( 14.95 ) | නගරයේ වෙනත් ආයතනලබාදෙන print Out ගාස්තුව සමාන වීමට |
| 04. Legal print Out | 17.00 + Vat (19.55 ) | 15.00+Vat (17.25 ) | නගරයේ වෙනත් ආයතන ලබාදෙන print Out ගාස්තුව සඳහා සමාන වීමට |

| | | | |
|---|---|---|---|
| 05එක්දින ඉන්ටර්නෙට් වැඩමුළුව | 250.00+Vat (287.50 ) | 500.00 + vat (575.00 ) | |
| 06.බ්ලොග් අඩවි නිර්මාණය හා සිංහල යුනිකෝඩ් භාවිතය පිළිබඳ එක්දින වැඩමුළුව | නව පරිගණක වැඩ මුළුවකි | 500.00+VAT (575.00 ) | පිරිවැය පියවා ගැනීමට |

05:06 <u>සැලසුම් කමිටු දීමනාව වැඩිකරගැනීම.</u>

උක්ත කරුණට අදාළව , නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසන්න සිල්වා මහතා විසින් එවා ඇති අංක 05/02/01/26/ හා 2008.10.25 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

සැලසුම් කමිටුවට සහභාගිවන කමිටු සාමාජිකයින්ට ගෙවන දීමනාව මෙම නගර සභාවේ මහ සභාව විසින් අනුමත කරන ලද දින සිට පහත සදහන් පරිදි වැඩිකර ගෙවීම පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියේ විරුද්ධත්වයක් නොමැති බව එමගින් දන්වා තිබිණ.

01. ප්‍රාදේශීය සභා සදහා දීමනාව රු.500/- සිට 750/- දක්වා පරාසයක
02. නගර සභා දීමනාව රු.750/- සිට 1000/- දක්වා පරාසයක.
03. මහ නගර සභා සදහා දීමනාව රු.1000/- දක්වා පරාසයක.

මෙම ගෙවීම් කිරීමේ දී ආයතනයට ලැබෙන පෙරසැරි ගාස්තු මුදල නොඉක්මවිය යුතු අතර, නාගරික සංවර්ධන අධිකාරිය මගින් මේ සම්බන්ධව නිකුත් කර ඇති අනිකුත් චක්‍රලේඛණ වලට ද අනුකූල විය යුතු බවද එමගින් අවධාරණය කර ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදුව මෙම නගර සභාවට අදාල වන දීමනාව ගෙවීම සුදුසු බවට තීරණය කරන ලදී.

05:07 <u>ගලී බවුසරයේ ගාස්තු සංශෝධනය කිරීම:</u>

මෙම නගර සභාව සතු ගලී බවුසරය නගර සභා සීමාවෙන් පිටත සේවා සදහා යෙදවීමේ දී කි.මී. 1 කට රු.100/- අයකරනු ලබන බවත්, එය අනෙකුත් ආයතන හා සැසදීමේ දී ඉතාම වැඩි බව දැනගැනීමට ලැබුණු බවත්, ඒ අනුව, එම මුදල යම් ප්‍රමාණයකින් සංශෝධනය කිරීම සදහා සහා තීරණයක් ගැනීම සුදුසු බවට යෝජනා කරමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ගමන් වියදම සදහා කි.මී. 01 කට රු.100/- බැගින් යාම සදහා පමණක් අයකිරීමට සභාවේ අනුමැතිය ලබාදුන් අතර, ෆිල්ටර් ශුද්ධ පවිත්‍ර කිරීමට රු.1000/- ක මුදලක් අයකිරීමටත් තීරණය කරන ලදී.

05:08 <u>පොහොර ඇසුරුම් කිරීමේ මලු ලබාගැනීම:</u>

බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය මගින් නිපදවන කාබනික පොහොර ඇසුරුම් කිරීම සදහා පහත සදහන් ප්‍රමාණයන්ගෙන් යුතු පොහොර ඇසුරුම් කිරීමේ මලු ( polysacks bag ) ලබාදෙන ලෙසත්, 2008.10.29 වන දිනට බැංකියවත්ත ගබඩාවේ පොහොර අතිරික්තයක් තිබෙන බැවින්, පොහොර අලෙවි කිරීම සදහා ක්‍රමයක් සකස් කරදෙන ලෙස ඉල්ලා මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිරිපත් කර ඇති 2008.10.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

| | |
|---|---|
| 01. 59 k.g bag | 5000 |
| 02. 25 k.g. bag | 3000 |
| 03. 10 k.g. bag | 2000 |
| 04. 2 k.g bag | 5000 |

මිළ ගණන් කැඳවා අවශ්‍ය පොහොර ඇසුරුම් කිරීමේ මලු ප්‍රමාණය මිළදී ගැනීමටත්, අතිරික්තව පවතින පොහොර ප්‍රමාණය සභාවේ වාහනයක් උපයෝගි කරගෙන පිට ප්‍රදේශ වලට ගොස් විකිණීමටත් තීරණය කරන ලදී.

05:09 <u>බැංකියවත්ත කසල මධ්‍යස්ථානයේ එකතු කරනු ලබන දිරා නොයන අපද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන මුදලින් 25% ක මුදලක් සේවකයින්ට ගෙවීම.</u>

උක්ත කරුණට අදාළව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති 2008.10.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ මිශ්‍ර කසල තේරීමේ කාර්යය වඩාත් හොඳින් ඉටුකරගැනීම සඳහා සේවකයින්ට දිරි දීමනාවක් වශයෙන් එම දිරා නොයන අපද්‍රව්‍ය අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමෙන් 25% ක මුදලක් අදාල සේවකයින් වෙත ගෙවීම සුදුසු බවටත්, එම මුදලට සරිලන සේ එම සේවකයින්ට කැඳ වීදුරුවක් හෝ එළකිරි වීදුරුවක් ලබාදීම හා වර්ෂ අවසානයේ දී යම් මුදලක් ඉතිරිව පවති නම්, එම මුදල සේවකයන් අතර බෙදාදීම සුදුසු බවටත් වාර්තා කර තිබිණි.

මේ සම්බන්ධව සාකච්ජා කල සභාව , දිරා නොයන අපද්‍රව්‍ය අලෙවි කර ලැබෙන ආදායමෙන් 25% ක මුදල පමණක් අදාල සේවකයින් හට ගෙවීමට තීරණය කරනලදී.

05:10 <u>ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳව පළාත් පාලන ආයතන වලට පුහුණු වැඩ සටහනක් හඳුන්වාදීම.</u>

උක්ත කරුණට අදාළව, මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිරිපත් කර ඇති 2008.10.29 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

Lirne Asia ආයතනයේ අනුග්‍රහය මත ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳව දිවයිනේ පළාත් පාලන ආයතන වල අදාළ සේවකයින්ට උක්ත පුහුණු වැඩ සටහන දින 02 ක පුහුණු පාඨමාලාවක් ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බවත්, මෙම පාඨමාලාව අවසානයේ දී සහතිකයක් නිකුත් කරනු ලබන අතර, පාඨමාලාව සඳහා සහභාගිවන එක් අයෙකුගෙන් රු.1000/- ක මුදලක් අයකරනු ලබන අතර, ඉතිරි මුදල Lirne Asia ආයතනයෙන් දැරීමට අපේක්ෂිත බවත්, ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙසත්, එමගින් ඉල්ලා තිබිණ. ඇස්තමේන්තු ගත මුදල වන, රු. 97,000/- මුදල එම ආයතනයෙන් දරන බැවින් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:11 <u>හිඟ වරිපනම් බදු නොගෙවීම:</u>

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශය තුළ හිඟ වරිපනම් බදු අයකරගැනීම සඳහා කිහිපවතාවක් ජනතාව දැනුවත් කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබුවද, හිඟ මුදල් ගෙවීමට කටයුතු නොකරනු ලබන හෙයින්, මෙම මුදල් අයකරගැනීම සඳහා පොදුවේ අධිකරණයට වාර්තා කර නඩු පැවරීම සුදුසු බවට 2008.10.29 දිනැතිව ආදායම් අංශයෙන් වර්තා කර තිබෙන බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදුව, එම වාර්තාව අනුව හිඟ වරිපනම් බදු නොගෙවා ඇති අයට එරෙහිව අධිකරණයට වාර්තා කොට, නඩු පැවරීම සුදුසු බවට තීරණය කරන ලදී.

05:12 <u>පෙර පාසල් දීමනාව වැඩිකරගැනීම:</u>

උක්ත කරුණට අදාළව, වැවවත්ත පෙර පාසලේ පාළිකාවන් විසින් ඉදිරිපත් කර ඇති 2008.10.19 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පවතින ආර්ථික දුෂ්කරතාවයක් සලකා බලා, දැනට ලබාදෙන රු.2000/- දීමනාව වැඩිකරදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සාකච්ජා කල සභාව දැනට ලබාදෙන රු.2000/- ක් වූ දීමනාව රු.4000/- දක්වා වැඩිකිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමට තිරණය කරන ලදී.

05:13 <u>කසල බද්ද සංශෝධනය කිරීම:</u>

මෙම නගර සභාව විසින් පනවා ඇති කසල බද්ද පිළිබඳව ව්‍යාපාරිකයින් කිහිප දෙනෙකු විසින් අදහස් දක්ව ඇති අතර, කසල බද්ද සදහා පහත සදහන් සංශෝධනයන් ඉදිරිපත් කරන අතර, ඒ අනුව කසල බද්ද පහත සදහන් ආයතන වලට ආදේශ කිරීමට යෝජනා කරමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිරිපත් කර ඇති 2008.10.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

| | |
|---|---|
| 01. සියලුම බාබර් සැලුන් මසකට | රු.100/- |
| 02. විදුරු විකුණන කඩ වලින් මසකට ( හාඩ්වෙයාර් ) | රු.250/- |
| 03. දැනට පනවා ඇති ගාස්තුවෙන් | රු.20% ක් අඩුකිරීම. |

අදාල ගැසට් නිවේදනය සංශෝධනය කිරීමටත්, ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන එය සිදුකිරීමටත් තිරණය කරන ලදී.

05:14 <u>කොම්පෝස්ට් පොහොර හැලීමේ යන්ත්‍රයක් සකස් කිරීම:</u>

දැනට කොම්පෝසට් ව්‍යාපෘතිය සතුව තිබෙන පොහොර හලන මැෂිම එම කාර්යය ඉටුකිරීමට ප්‍රමාණවත් නොවන අතර, එහි ඇති අඩුපාඩු හදුනාගෙන පහසුවෙන් පොහොර හැලිමේ කාර්යය ඉටුකිරීම සඳහා සුදුසු යන්ත්‍රයක් මිළදිගෙන ලබාදෙන ලෙස ඉල්ලා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති 2008.10.30 දිනැති ලිපිය සභාගත කරන ලදුව, මිළ ගණන් කැඳවා සුදුසු වර්ගයේ යන්ත්‍රයක් මිළදි ගැනිමට තිරණය කරන ලදී.

05:15 <u>ගෝඝාතකාගාර බලපත්‍රය ලබාගැනීම - 2009 වර්ෂය:</u>

උක්ත කරුණට අදාළව බළන්ගොඩ, මිරිස්වත්ත අංක:260 දරණ ලිපිනයේ පදිංචි ඩී.එම්.ෆලීල් මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, මේ සම්බන්ධව පසුව සලකා බලා තිරණයක් ගැනිම සුදුසු බවට තිරණය කරන ලදී.

05:16 <u>ජලය ලබාගැනීම:</u>

බළන්ගොඩ , තුඹගොඩ, අංක: 196/ඒ වෙට්නෝල් පාර,එපිටපැත්ත යන ලිපිනයේ පදිංචි ආබාධිත සෙබල යු.ආර්. ප්‍රසාද් බුද්ධික කුමාර යන අය විසින් ජලය ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, මෙම අය විසින් ඉල්ලුම් කරන ලද ජල මුලාශ්‍රයෙන් ජලය ලබාගැනිම සම්බන්ධව, විරෝධතාවයක් නොමැති බවත්, එය ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන බවත් ප්‍රාදේශිය ලේකම්, බලන්ගොඩ වෙත දන්වා යැවීමටත් තිරණය කරන ලදී.

05:17 <u>2009 වර්ෂය සදහා මස්කඩ බදුදීම:</u>

2009 වර්ෂය සදහා පොදු වෙළදසල එළහරක් මස් කඩය,එළුමස් කඩය හා කුකුළු මස් කඩය ටෙන්ඩර් කල යුතුව ඇති බවත්, ඒ සදහා සභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින් විෂය භාර නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, ඉහත සදහන් මස් කඩ 2008 වර්ෂයේ

ටෙන්ඩර් කල මුදලටම 2009 වර්ෂය සදහා ද ටෙන්ඩර් කිරීම සුදුසු බවටත්, ටෙන්ඩර් විවෘත කිරීම 2008.11.27 වන දින පෙ.ව.11.00 ට සිදුකිරීමටත් තිරණය කරන ලදී. පුවත්පත් දැන්වීමක් මගින් මෙය ප්‍රසිද්ධ කිරීමට වැඩිදුරටත් තිරණය විය.

- බළන්ගොඩ පොදු වෙළඳසැලෙහි එළවළු කඩ වල කඩ කුලිය 2009 වර්ෂය සඳහා රු.2000/- කින් වැඩි කිරීම සුදුසු බවටත්, මේ පිළිබඳව කඩ හිමියන් කැඳවා සාකච්ඡා කිරීමටත් තීරණය කරන ලදී.

05:18 <u>ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම:</u>

උක්ත කරුණට අදාළව බලන්ගොඩ, ප්‍රාදේශීය ලේකම් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ලේකම් විසින් එවා ඇති 2008.10.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම 2008.11.03 වන දින පෙ.ව.10.00 ට ගරු වාරි මාර්ග අමාත්‍ය ජයතිස්ස රණවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇති බවත්, එම කමිටුවට ඉදිරිපත් කිරීමට විශේෂ යෝජනා/ගැටළු තිබේ නම්, 2008.10.30 දින හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලෙස දන්වා තිබිණ.

උක්ත කමිටු රැස්වීම සඳහා පහත සඳහන් යෝජනාවන් ඉදිරිපත් කිරීමට සභාව තීරණය කරන ලදී.

| | යෝජනාව | ඉදිරිපත් කල ගරු මන්ත්‍රීතුමා |
|---|---|---|
| 01. | බළන්ගොඩ විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයක් බලන්ගොඩ ස්ථාපිත කිරීම | ගරු ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 02. | හොරකැටිය මහමෙව්නා මාවතෙහි ඉදිකිරීම් අවහිරනා ඉවත් කර සංවර්ධනය කිරීම. | ගරු සභාපතිතුමා |
| 03. | මැසි මදුරු උවදුර මර්ධනය කිරීම සඳහා මෙම නගර සභාව, බලන්ගොඩ හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවන් එක්ව වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම. | ගරු සභාපතිතුමා |
| 04. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නගරයේ අලුතින් ඉදිකර ඇති වටරවුම් නගර සභාවට පැවරීම. | ගරු සභාපතිතුමා |
| 05. | බාන්ස් රත්වත්ත මාවතේ ගෝල්ඩන්සන්සිටි ආයතනය හා කුසුම්සිරි වෙළඳසල අසල ඉදිරිපිට මාර්ගයේ කැඩී ඇති කොටස් අලුත්වැඩියා කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියවෙත දැනුම්දීම. | ගරු සභාපතිතුමා |
| 06. | බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ විථි පහන් විශාල වශයෙන් අක්‍රියව පවතිනබැවින්, ඒ සඳහා විථි පහන් විදුලි බලමණ්ඩලයෙන් ලබාගැනීමට විදුලි බලමණ්ඩලයේ අවධානය යොමුකිරීම. | ගරු ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා/විමලසේන වැවේගෙදර මැතිතුමා. |

- බලගහමුල කාණුව ක්‍රමවත්ව සකස් කර නොමැති නිසා, ජල බැසයාමක් සිදුනොවන බැවින්, එය ක්‍රමවත්ව සකස් කරන ලෙස ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. විමලසේන මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

06. <u>මුදල් ගෙවීම් අනුමත කිරීම</u>:( රු.10000/- ට වැඩි ගෙවීම්)

2008.09.18 සිට 2008.10.29 දින දක්වා ගෙවන ලද රු.10000/-ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

| | | |
|---|---|---|
| 01. | එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර්<br>ගල් සැපයීම. 6x9 - 4x4 -3/4 | රු. 72173.20 |
| 02. | යශෝධා හාඩ්වෙයාර්<br>කර්මාන්ත අංශය සඳහා ද්‍රව්‍ය ලබාගැනීම | රු. 19485.00 |
| 03. | මෙට්‍රොපොලිටන් ඔපිස් පු.ලි.<br>අනු පිටපත් යන්ත්‍ර සඳහා ටෝනර් 06 ක්<br>ලබාගැනීම | රු. 15870.00 |
| 04. | ග්‍රාම සංවර්ධන සමිතිය කිරිදිගල<br>ඕවගන්තොට රබර්වත්ත ඉහලගම ගුණපාල<br>මහතාගේ නිවස දක්වා පාර කොන්ක්‍රීට් කිරීම | රු. 45386.95 |
| 05. | සභාපති, තුඹගොඩ ගොවි සංවිධානය<br>පල්ලෙවෙල ළිඳ අසල අතුරු මාර්ගය සංවර්ධනය<br>කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | රු. 387514.61 |
| 06. | තුඹගොඩ ගොවි සංවිධානය<br>පල්ලෙවෙල ළිඳ අසල අතුරු මාර්ගය අඩි 100 ක්<br>කොන්ක්‍රීට් කිරීම, එපිටපැත්ත දෙවට මාර්ගය<br>අඩි 100 ක් කොන්ක්‍රීට් කිරීම. | රු. 228885.93 |
| 07. | එච්.බී.ගුණරත්න<br>වැලි කියුබ් 09 ක් සැපයීම | රු. 36000.00 |
| 08. | එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර්<br>3/4 ගල් කියුබ් 05 ක් සැපයීම | රු. 24700.50 |
| 09. | නමිතා හාඩ්වෙයාර්<br>සිමෙන්ති මිටි 60 ක් සැපයීම අල්ට්‍රාටෙක් | රු. 45738.00 |
| 10. | අල්මේදා හාඩ්වෙයාර්<br>කර්මාන්ත අංශය සඳහා සිමෙන්ති ලබාගැනීම | රු. 44847.00 |
| 11. | සාමාන්‍යාධිකාරී, ලං.වි.ම.<br>කාර්යාලය - 2008 අගෝස්තු විදුලි බිල්පත | රු. 15840.00 |
| 12. | සාමාන්‍යාධිකාරී - ලං.වි.ම.<br>2008 අගෝස්තු විදුලි බිල පියවීම.<br>පො.වෛ.සැ/ප්‍රේක්ෂකාගාරය | රු. 12336.00 |
| 13. | රිෂානා සර්විස්<br>අංක: 227-5020 ගලි බවුසරය 2008.09.13 පූර්ණ<br>සේවා කිරීම. | රු. 10688.50 |
| 14. | දේශීය ආදායම් කොමසාරිස්<br>2008 ජුනි/ජුලි මාස වල රඳවුම් බදු මුදල් ගෙවීම | රු. 41891.70 |
| 15. | සිගිරි ප්‍රින්ටර්ස්<br>අයකැමි ලේඛණ 100 ක් මිළදී ගැනීම | රු. 19975.00 |

16. ඊ.ජී.චන්ද්‍රරත්න
පොහොර කිලෝ ග්‍රෑම් 10,000 ක් හැලීම වෙනුවෙන් රු. 10000.00

17. දේශීය ආදායම් කොමසාරිස්
2008.08.01 සිට 2008.08.31 දක්වා වැට් බදු
ගෙවීම. රු. 110640.00

18. සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ වි.සේ.ස.
2008.09.01-2008.09.08 දක්වා ඉන්ධන බිල රු. 125720.00

19. උපාලි එන්ටර්ප්‍රයිසස්
බ්ලොක් ගල් ලබාගැනීම රු. 11625.00

20. ල/බැ.බලන්ගොඩ
ලංකා බැංකු ජංගම ගිණුමෙන් 2008.09.10
ලබාගත් මුදල අත්තිකාරම් පියවීම. රු.500000.00

21. නිව් ජෝති ස්ටෝර්ස්
කාර්යාලය සඳහා ලිපි ද්‍රව්‍ය ලබාගැනීම රු. 21953.25

22. ටී.එම්.අයි.සමන්සිරි
පරිඝණක දත්ත මධ්‍යස්ථානයේ පිළිසකර කිරීම
හා විදුලි සම්බන්ධතාව සඳහා රු. 15700.00

23. මධුෂානි එන්ටර්ප්‍රයිසස්
තොරතුරු මධ්‍යස්ථානයේ දොරවල් සවිකිරීම රු. 10780.00

24. වික්ටරි කන්ස්ට්‍රක්ෂන්
මුගුණමලේ පාර කොන්ක්‍රීට් කිරීම රු. 12000.00

25. සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා
2008.09.08 සිට 2008.09.13 දක්වා ඉන්ධන
බිල රු. 64244.00

26. සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා
2008.09.15 සිට 2008.09.18 දක්වා ඉන්ධන
බිල රු. 57588.80

27. සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා
සිමෙන්ති මිටි 300 ක් මිලදී ගැනීම
ප්‍රවාහන ගාස්තු සමග රු. 235500.00

28. මොබිටෙල් පුද්ගලික සමාගම
රාජ්‍ය උපහාර පැකේජය ලබාගැනීම රු. 29000.00

29. රිචඩ් ප්‍රැන්සිස්
කර්මාන්ත අංශය සඳහා වැලි 6 1/2 ලබාගැනීම රු. 25740.00

30. බී.ගුණරත්න
නගරයේ කසල එකතු කිරීම සඳහා සේවකයන්
යෙදවීම රු. 86500.00

31. මහජන බැංකුව ආදීපාද වීදිය,වි.වැ.අ.
2008 මැයි මස බිල්පත හා හිග මුදලින්
කොටසක් ගෙවීම. රු. 53615.07

32. කේ.ඩබ්.ඩී.සුරවීර
ඉදිරිපස මල්ගස් ආවරණයක් සකස් කිරීම. රු. 10800.00

32. පළාත් ආදායම් කොමසාරිස්
රුඳවුම් බදු ගෙවීම රු. 13488.64

33. ශ්‍රී ලංකා ටෙලිකොම්
දුරකථන බිල පියවීම
2008 අගෝස්ත මාසය
87275/87153/86596 රු. 16902.28

34. ඊ.ජී.චන්ද්‍රරත්න
පොහොර කි.ග්‍රෑ. 35000 හැලීම සඳහා ගෙවීම රු. 35000.00

35. ජල සම්පාදන මණ්ඩලය
2008 සැප්තැම්බර් ජල බිල පියවීම
පොදුවෙළඳසල/පිංතාලිය රු. 16088.50

36. ඉඹුල්පේ විවිධ සේවා
2008.09.22 සිට 2008.09.30 දක්වා ඉන්ධන
බිල පියවීම. රු. 133735.40

37. ඉඹුල්පේ විවිධ සේවා
2008.09.15 සිට 2008.09.23 දක්වා ඉන්ධන
බිල පියවීම. රු. 97506.10

38. බී. ගුණරත්න
නගරයේ කසල එකතු කිරීම සඳහා සේවකයින්
යෙදවීම. රු. 86500.00

39. තුඹගොඩ ගොවි සංවිධානය
සඳුන්ගම පාර අවසන් කොටස කොන්ක්‍රීට් කිරීම
කර්මාන්තයේ අවසන් ගෙවීම් කිරීම රු. 294513.15

40. ජේ.එම්.ඩිස්ට්‍රිබියුටර්ස්
විථී පහන් , කාර්යාලය,තොරතුරු මධ්‍යස්ථානය,
බස්නැවතුම්පල සඳහා විදුලි අලුත්වැඩියාවක් වෙනුවෙන්
බල්බ හා හෝල්ඩර් ලබාගැනිම. රු. 43411.50

41. ජේ.එම්.සාබු
තොරතුරු මධ්‍යස්ථානය සඳහා තිර රෙදි සියලු
උපාංග සහිතව සපයා සවිකිරීම. රු. 28606.05

42. නැෂනල් මෝටර්වේස්
37-7933 ට්‍රැක්ටරයේ ඇන්ජිම අලුත්වැඩියා කිරීම රු. 135987.92

43. එම්.ජී.පියසේන
පෞද්ගලික බස් ගාල් ගාස්තු වලින් තැන්පත්
ආපසු ගෙවීම. රු. 21750.00

44. හේලීස් ඇග්‍රෝ ප්‍රොඩක්ස් ලිමිටඩ්
සෞඛ්‍ය අංශය සඳහා බෙහෙත් ද්‍රව්‍යයන් මිළදී ගැනිම රු. 58261.50

45. ශ්‍රී ලංකා ටෙලිකොම්
දුරකථන බිල පියවීම රු. 18440.46

46. විජිත ගල් කැටයම්
සමරු ඵලක සඳහා රු. 19000.00

47. විජිත ගල් කැටයම්
සමරු ඵලක සඳහා රු. 20000.00

48. ඊ.ජී.චන්ද්‍රරත්න
පොහොර 15000 ක් කි.ග්‍රෑ. හැලීම වෙනුවෙන්
ගෙවීම. රු. 15000.00

49. එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර්
කර්මාන්ත අංශය සඳහා ගල් සැපයීම රු. 64944.60

50. එච්.බී. ගුණරත්න
කර්මාන්ත අංශය සඳහා වැලි සැපයීම රු.27720.00

51. දිලුමිණ බිල්ඩර්ස්
හියුම් පයිප්ප මිලදී ගැනීම රු.16600.00

52. ශ්‍රී ලංකා ටෙලිකොම්
දුරකථන බිල -87275/87153/86596
2008 සැප්තැම්බර් රු.18871.14

53. දෙහිගස්තලාව ග්‍රාමීය සමෘද්ධි බලකාය
මිරිස්වත්ත ගහ අද්දර පාර කොන්ක්‍රීට් කිරීම
කර්මාන්තයේ අවසන් කොටස ගෙවීම. රු. 379388.82

54. සාමාන්‍යාධිකාරී,
ඉඹුල්පේ විවිධ සේවා.
2008.10.02 සිට 2008.10.08 දක්වා ඉන්ධන
බිල පියවීම. රු. 118716.20

55. එන්.එස්.ලියනගේ රු. 1560802.71
බලන්ගොඩ බස් නැවතුම්පලේ පිවිසුම්
මාර්ගයේ පැති කාණු හා පදික වේදිකාව
ඉදිකිරීම පළමු කොටස් ගෙවීම.

56. දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්
වැට් මුදල් ගෙවීම. රු. 71596.45

57. දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්
වැට් මුදල් ගෙවීම. රු. 14319.29

58. සී/ස කියැන්නැම් එන්ටර්ප්‍රයිසස්
1% පිරිවැටුම් බදු මුදල ආපසු ගෙවීම. රු. 19537.49

59. දේශිය ආදායම් කොමසාරිස්
2008.08.01 සිට 2008.08.31 දක්වා වැට් මුදල රු. 42102.00

60. සාමාන්‍යාධිකාරී ලං.වි.බ.ම
2008 සැප්තැම්බර් මස විදුලි බිල ගෙවීම. රු. 52006.20

61. සාමාන්‍යාධිකාරී ජලසම්පාදන මණ්ඩලය
2008 සැප්තැම්බර් මස ජල බිල පියවීම. රු. 30649.00

62. සෙනුර සිවිල් ඉංජිනියරින්
බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කසළ
කළමණාකරණ කටයුතු සඳහා ගොඩනැගිල්ල
ඉදිකිරීම කර්මාන්තයේ 20% අත්තිකාරම රු. 1576267.32

මෙම මුදල් ගෙවීම් සියල්ල අනුමත කිරීමට සභාව තීරණය කරන ලදී.

07. <u>ඇස්තමේන්තු අනුමත කිරීම:</u>

01. කුමාරගම විහාරස්ථානයට හා අවට නගර වැසියන්ට පොදු ජල සේවා සැපයීමේ ජල ව්‍යාපෘතිය සඳහා ජල මෝටරයක් සහ ලීටර් 2000 ජල ටැංකියක් සැපයීම පිණිස ඉදිරිපත් කර ඇති රු.37000/- ක වටිනාකමින් යුතු ඇස්තමේන්තුව සභාවේ ආවරණ අනුමැතියට ඉදිරිපත් කර තිබුණු අතර, ඒ සඳහා සභාවේ ආවරණය අනුමැතිය ලබාදෙන ලදී.

08.1 <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ</u> : නැත

11. <u>යථා පරිදි කල් දී ඇති යෝජනා:</u> නැත

09. <u>ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම</u>: නැත

10. <u>යෝජනා</u>

10:01 මෙම නගර සභාවේ සේවාවන් හා භාණ්ඩ/උපකරණ මිළදී ගැනිම සඳහා 2009 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට පුවත් දැන්වීමක් පළකිරීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. <u>කාරක සභා වල වාර්තා සලකා බැලීම</u>:

- 2008.09.01 සිට 2008.09.30 දක්වා වාහන සඳහා වැය වු ඉන්ධන. පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව, සභාව විසින් එය සම්මත කරන ලදී.

12. <u>ආදායම් වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත්කිරීම:</u>

12:01 <u>**2009 වර්ෂය සඳහා අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීම:**</u>

2009 වර්ෂය සඳහා සකස් කර ඇති අයවැය ලේඛණයේ කෙටුම්පත සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව,

| | |
|---|---|
| 2009 ඇස්තමේන්තුගත පුනරාවර්තන ආදායම් | රු. 46949500.00 |
| ඒ අනුව, 2009 ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් | රු. 38881500.00 |
| අතිරික්තය | රු. 8065000.00 |
| අඩුකලා: පුස්තකාල පොත් මිළදී ගැනීම සඳහා | රු. 200000.00 |
| අතිරික්තය | රු. 7865000.00 |

ගෙවිය යුතු ණය මුදල් සහ පොළිය

| | |
|---|---|
| i. බැක්හෝ යන්ත්‍රය සඳහා | 358008.04 |
| ii. කාණු පද්ධතිය සඳහා | 705246.00 |
| iii. නව බස්නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය සඳහා | 14333825.96 |
| එකතුව | (15597080.92 ) |
| ඌණතාවය | (7732080.92 ) |

මෙම අයවැය කෙටුම්පත සභා සම්මත කිරීමට ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් යෝජනා කල අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව, අයවැය කෙටුම්පත සභා සම්මත විය.

2009 වර්ෂය සඳහා සකස් කර ඇති මෙම අයවැය ලේඛණයට පහත සඳහන් යෝජනා ද ඇතුළත්විය යුතු බව ගරු සභාපතිතුමන් විසින් දැන්විය.

01. කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා කුණු ඇදීමේ යන්ත්‍රයක් මිළදී ගැනීම හා දැනට භාවිතා කරන හලරය ඉවත්කොට නව හලරයක් මිළදී ගැනීම සඳහා ලක්ෂ 10 ක මුදලක් වෙන්කිරීම.

02. කාර් නැවතුම් ස්ථානයේ දෙමහල් සාප්පු සංකීර්ණය ඉදිකිරීම.

03. විදුලිබලාගාර ඉඩමේ මායිමේ පදික වෙළඳුන්ට කඩ කාමර 30 ක් ඉදිකිරීම

- මෙම සභාවේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට තමන් නියෝජනය කරනු ලබන කොට්ඨාශ වල සංවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා මුදල් වෙන්කර නොදීම සම්බන්ධව සිය කණගාටුව ප්‍රකාශ කරන බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්. විමලසේන මැතිතුමා විසින් දැන්වීය. ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම තමා අතිගරු ජනාධිපතිතුමන් වෙත ද යොමු කර ඇති බව, ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

12:02 2008 සැප්තැම්බර් මාසයට අදාල ආදායම් හා වියදම් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්තන ගෙවීම් | 3514374.12 |
| වෙනත් ගෙවීම් | 808564.35 |
| | ----------- |
| මුළු ගෙවීම් | 4722938.47 |
| | ======== |
| ලැබීම්-2008 සැප්තැම්බර් | |
| පුනරාවර්ථන ලැබීම් | 2699633.90 |
| වෙනත් ලැබීම් | 1305532.94 |
| | ---------- |
| මුළු ලැබීම් | 4005166.84 |
| | ======== |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

13. <u>වෙනත් කරුණු:-</u>

13:01 <u>ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:</u>

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, මෙම වර්ෂයේ ඉටුකල සංවර්ධන වැඩ අතරින්, බුලත්ගම වසම තුල ලක්ෂ 78 ක සංවර්ධන යෝජනා ඉටුකර ඇති බවත්, ඒ සම්බන්ධව සිය ස්තුතිය ගරු සභාපතිතුමා/ලේකම්තුමා/ගරු මන්ත්‍රීතුමන්ලා/අදාල නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන් වෙත පළකරසිටින සිටින බවත් දැන්විය.

දැනට සති දෙකකට පමණ පෙර බුලත්ගම වසමේ මාර්ගයක් සංවර්ධනය කිරීමේ උත්සව අවස්ථාවකදී ගසක් කඩා වැටී පුද්ගලයෙකු මරණයට පත් වු බව පැවසිය. එම ස්ථානයේ විථි පහනක් නොමැති නිසා මහජනතාව එකී ස්ථානයෙන් ගමන් කිරීමට බියක් දක්වනු ලබන බවත්, එබැවින්, එම ස්ථානයට විථි පහනක් සවිකිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

නගර සභා බලප්‍රදේශයේ මාර්ග නඩත්තුව හා සංවර්ධනය සඳහා දැනට සිටින කම්කරුවන් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන නිසා, මාර්ග කම්කරුවන් වැඩි පිරිසක් බඳවා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

13:02 <u>ගරු නාගරික මන්ත්‍රී, ඊ.ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා:</u>

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, බලන්ගොඩ නගර සභාව තවත් එක් ප්‍රජා සේවාවක් ලෙස නව කියවීම් ශාලාවක් ජනතාවට අයිතියට පැවරීමේ කාර්යය අද දින සිදුකල බවත්, එය ඉතා වටිනා කාර්යයක් ලෙස තමා සලකනු ලබන දැන්විය. එම කියවීම් ශාලාව අසල විදුලි ට්‍රාන්ස්ෆෝමරයක් තිබෙන බවත්, එයින් අනතුරක් සිදුවීමට පෙර එය වටා කම්බි වැටක් ගසා ආවරණය කරන ලෙසත්, කියවීම් ශාලාව වටා ද කම්බි වැටක් ගසා ආවරණය කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

තවදුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා කිරිදිගල ජයන්ති ලිඳ පාර ඉතා අබලන් වී ජනතාවට ගමන් කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බැවින්, එම මාර්ගය සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී. නගරයේ විථි පහන් අක්‍රමවත්වී ඇති නිසා, මහජනතාව සභාව වෙත දෝෂාරෝපණය කරනු ලබන බවත්, එම නිසා, විදුලි කම්කරු මහතා ලවා විථි පහන් ක්‍රමවත් කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව නිම කරන ලදී.

13:03 <u>ගරු නගර සභා මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා:</u>

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, බලන්ගොඩ ක්‍රීඩාපිටිය පිටුපස මාර්ගය සංවර්ධනය කර තිබෙන නිසා, අධික වේගයෙන් වාහන ධාවනය කරන බවත්, එබැවින්, වාහන වල වේගය සීමා කිරීම සඳහා තාර කට්ට (ගැප්) දෙකක් යොදන ලෙස ඉල්ලා සිටින ලදී.

සරස්වතිවත්ත සුසාන භූමියට යන මාර්ගය හා සුසාන භූමි පරිශ්‍රය කැලෑ වැවී ඇති බැවින්, එය ශුද්ධ පවිත්‍ර කරන ලෙස ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා, බලන්ගොඩ ජාතික පාසලේ 11 වසරේ ඉගෙනුම ලබන ශිෂ්‍යයකු විසින් අංග සම්පූර්ණ හා කාර්යක්ෂම තැපැල් යන්ත්‍රයක් නිපදවා ඇති බවත්, රටවල් 854 කින් මෙම සිසුවාගේ නිර්මාණය 06 ස්ථානයට තේරීපත්ව ඇති බවත්, නමුත් ඔහුගේ නම කුසලතා ලේඛණයෙන් කපා හැර ඇති බව දැනගැනීමට ලැබී ඇති බවත් එබැවින්, මෙම සිසුවාට සිදුවී ඇති අසාධාරණය සම්බන්ධව අදාල විෂය ගරු අමාත්‍යතුමන් වෙත දන්වා යැවීමට තමන් යෝජනා කරන බව දන්වමින් සිය කථාව නිම කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

14. <u>අවසානය:</u>

<u>ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:</u>

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාටත්, ලේකම් මහතාටත් සිය ස්තුතිය පුදකරමින්, ප.ව.01.45 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.